
ඉතිහාසය -10 ශ්‍රේණිය

4 පාඩම

# ශ්‍රී ලංකාවේ පැරණි සමාජය



අපේ රටේ ඉතිහාසය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට නම් සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳව තොරතුරු ඉගෙන ගැනීමට අපට සිදු වේ.මේ සඳහා අප ශ්‍රී ලංකාවේ පැරණි සමාජය පිළිබඳව තොරතුරු ඉගෙන ගත යුතුය. එහි දී මුලාශ්‍ර වල සඳහන් කරුණු අධයයනය කිරීම ඉතා වැදගත් වේ.

## 4.1පාලනයේ ස්වරූපය

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය

ව්‍යවස්ථාදායකය යනු රටක නීති සම්පාදනය කරන ආයතනයයි.

අතීතයේදී → විධායකය + අධිකරණය = රාජ සභාව

වර්තමානයේදී → ව්‍යවස්ථාදායකය+ විධායකය+ අධිකරණය= පාර්ලිමේන්තුව

අතීතයේ දී මෙරට පැවතියේ රාජාණ්ඩු පාලන ක්‍රමයකි.

අතීතයේ දී විධායකය සහ ව්‍යවස්ථාදායකය හඳුන්වන ලද්දේ එක්තැන්සමිය යනුවෙනි.

"වත්හිමියන් වහන්සේ වදාළ එක්තැන්සමියෙන්"

(ක්‍රි.ව 9 වන සියවස අනුරාධපුර බුද්ධන්නේහෙල සෙල්ලිපිය)

අතීතයේ දී අධිකරණය සභාව යන නමින් හඳුන්වා ඇත.

"සභායෙන් ආ මැණින්ගමු උදඹි ඉසා නිකවැලි සෙනු ඉසා"

(අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සොයාගත් සෙල්ලිපියක්)

- මහා ලේඛක, මහා ලේකම් සඳහා ද මහලේ යන වචනය භාවිතා කර ඇත. උදා - මහලේ කස්බා

## රජයට සම්බන්ධ වෙනත් පරිපාලන ඒකක

**නාගදීපය පාලනය කළ, පියංගුකතිස්ස විහාරය කරවූ සෘෂිගිරි නම් අමාත්‍යවරයා**

**(වසභරජු කළ කරවූ වල්ලිපුරම් රන් සන්නස)**

## ප්‍රා දේශීය මට්ටමේ පරිපාලන ඒකක

- **ගම් පාලනය කළ දසදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලය දසගම් ඇත්තන්**

**(මාතලේ කළුදිය පොකුණ ශිලා ලිපිය)**

## සෞඛ්‍ය පහසුකම්

- **දෙවන සේන රජු (ක්‍රි.ව 853-887) විසින් කරවූ මිහින්තලය පැරණි රෝහල**
- **වෙජ්ජසාලා → වෛද්‍ය ශාලා**
- **වෙජ → වෛද්‍යවරු**

## වෛද්‍ය සේවය නගා සිටු වීමට කටයුතු කළ රජවරුන්

- **බුද්ධදාස රජු රෝහල් ඉදි කිරීම.**
- **පස්වන මිහිඳු රජු රෝහල්වලට සියලු අවශ්‍යතා ලබා දීම.**
- **හතරවන කාශ්‍යප රජු උග්ගාරෝසන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා රෝහල් ඉදි කිරීම.**
- **පළමුවන උපතිස්ස රජු පසවන්තිනාම ශාලා, තිඹිරිගෙය හෙවත් මාතෘ නිවාස ඉදි කිරීම.**
- **පණ්ඩුකාභය රජු සොත්තිශාලා ඉදි කිරීම.**




**මිහින්තලේ පැරණි රෝහල**




<u>රජවරුන් අසල්වැසි හා දුරු රටවල් හා සබඳතා පවත්වා ගත් ආකාරය</u>

- ආසියාතික රටවල්
- අරාබි රටවල්
- යුරෝපා රටවල් රටවල්
- අසල්වැසි රටවල් හා පැවැත් වූ සබඳතා

- **පළමුවන ගජබා රජු ඉන්දියාවේ චේර රාජ්‍ය යේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වීම.**
- **භාතිකාභය රජු විදුරු පබළු ගෙන්වා ගැනීමට රෝමයට තානාපතිවරුන් යැවීම.**
- **හයවන අග්බෝ රජු චීනය සමඟ සමීප සබඳතා පවත්වා ගැනීම.**
- **පළමුවන විජයබාහු රජු තිලෝකසුන්දරී නම් කාලිංග වංශික කුමාරිකාවක් විවාහ කර ගැනීම.**
- **පළමුවන විජයබාහු රජුගේ සොයුරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය දේශයේ කුමාරයෙකු හා විවාහ වීම.**
- **පළමුවන විජයබාහු රජු පොළොන්නරුව දළදා මාළිඟයේ ආරක්ෂාව සඳහා වෙල්ලක්කාර නම් කුලී හමුදාව ගෙන්වා ගැනීම.**




**වෙල්ලක්කාර හමුදාව**

## 4.2 ආර්ථිකය

### ගොවිතැන

1. ගොඩ ගොවිතැන
2. මඩ ගොවිතැන


### ගොඩ ගොවිතැන හෙවත් හේන් වගාව

- උම්මග්ග ජාතකය හේන් හැඳින්වීම සඳහා **සේන්** යන නාමය භාවිතා කර ඇත.
- සෙල්ලිපිවල **පිටබිම්** යනුවෙන් හේන් හඳුන්වා තිබේ.
- බුත්සරණ නම් සාහිත්‍ය ග්‍රන්ථයේ **සෙහෙන්** ලෙස හේන් නම් කර තිබේ.

### හේන් වගාව හා සම්බන්ධ පැරණි වචන

- නවදැලි හේන → අලුතින් ගිනිතබා සක්ස් කරන ලද හේන
- කනත්ත → අතහැර දමා තිබී නැවතත් වගා කළ හේන
- දඬු වැට → හේන වටා ආරක්ෂාවට ඉදි කරන වැට

- කැති අඩ,කෙටු කනබ → හේන් වගාව සඳහා අය කළ බදු



## මඩ ගොවිතැන හෙවත් වී වගාව

- ❖ යල කන්නය
- ❖ මහ කන්නය
- ❖ මැද කන්නය

### වියළි කලාපයේ ජලය සුරක්ෂිත කර ගැනීමේ වැදගත්කම

"අහසින් වැටෙන එක් දිය බිඳක්වත් ප්‍ර යෝජනයට ගත නොහැකිව මුහුදට යාමට ඉඩ නොදිය යුතු බව"

## සත්ත්ව පාලනය

- ❖ ගෝපාල ගම්
- ❖ කිරිගෙරි

## කර්මාන්ත 4.2.2

- ❖ යකඩ වැඩ කළ කම්මල්කරුවන් → කබර ( කම්මාර)
- ❖ තඹ වැඩ කළ ශිල්පීන් → තබකර
- ❖ ඇත්දත් කර්මාන්ත ශිල්පීන් → දටික
- ❖ මැටි කර්මාන්ත ශිල්පීන් → කුම්භකාර/ කුබකර
- ❖ රෙදි වියන ශිල්පීන් → තතවය

## 4.2.3 වෙළඳාම

**01.** අනුරාධපුර
**02.** මාගම

- ❖ අනුරාධපුර නගරයේ දකුණු දොරටුව අසල කාළසුමන නම් වෙළඳපළක් තිබී ඇත.
- ❖ සීගිරියේ බටහිර ජල උද්‍යානයේ සෙල්ලිපියක අබල වපර නමින් හැඳින්වෙන සියඹලා වෙළෙන්දකු ගැන සඳහන් වේ.
- ❖ වෙළඳ සංවිධාන පූගය නමින්ද ඇතැම් තැන් වලදී නියාමස්ථාන නමින්ද හඳුන්වා ඇත.
- ❖ වෙළඳාමේ නියුතු පිරිස් වානිජ නමින් හෝ වාපර නමින් හඳුන්වා ඇත.
- ❖ අනුරාධපුරයට පැමිණි සුරනිමල නම් තැනැත්තා වෙළඳපළකින් සුවඳ විලවුන් මිළට ගත් බව සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් වේ.
- ❖ හතරවන උදය රජුගේ හෝපිටිගම ශිලා ලිපියේ සහ සොරබොර වැවැ ටැම් ලිපියේ පුරාණ වෙළඳපළ ගැන තොරතුරු සඳහන් ය.
- ❖ නානාදේසී වෙළඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රවක් හම්බන්තොටින් සොයාගෙන ඇත.
- ❖ දකුණු පළාතේ බෝවත්තේගල සෙල්ලිපියේ කබොජ මහ පුගිය ලෙස කාම්බෝජ වෙළන්දන් හඳුන්වා ඇත.

## පුරාණ කාලයේ පහත සඳහන් වෘත්තීකයන් ද සමාජයේ කැපී පෙනුණි.

- ➢ ගුරුවරුන්
- ➢ වෛද්‍යවරු
- ➢ නීතිවිශාරදයින්
- ➢ විවධ ශිල්පීන් → නැට්ටුවන්,සිත්තරුන්
- ➢



**හස්ති ආචාර්ය**


## 4.3 සංස්කෘතිය

### 4.3.1 ආගම

- ක්‍රි.ව තෙවන සියවසේදී මහින්දාගමනයත් සමඟ මෙරට බුදු දහම ප්‍රචලිත වීම.
- කටාරම් කොටන ලද ගල්ලෙන් භික්ෂූන් වහන්සේ උදෙසා පූජා කිරීම.
- පූජා කළ අයගේ නම ගල්ලෙන් වල ඉහලින් කොටා තිබීම.




කටාරම් සහ සෙල්ලිපි සහිත ගල් ලෙන් → මිහින්තලය, වෙස්සගිරිය,සීගිරිය,රිටිගල




භාණකවරු

- පන්සල් හඳුන්වා ඇත්තේ පණ්ණසාලා යන නමිනි.
- නායක ස්වාමීන් වහන්සේලා තෙර යනනුවෙන් හඳුන්වා ඇත.
- නායක ස්වාමීන් වහන්සේලා සමීපයේ විසූ භික්ෂූන් සද්විහරිය ලෙස නම් කර ඇත.
- ධර්ම පුළුල් බැවින් ධර්මය කටපාඩමින් තබා ගත් පිරිස් භාණකවරු නම්විය.

දීඝ නිකාය → දීඝ භාණක

සංයුක්ත නිකාය → සංයුක්ත භාණක

- වස්සාවාසික, වස්වස්සන යන අර්ථය දවස වසික සාථක යනුවෙන් කඨින චීවරය ද හඳුන්වා තිබේ.

## 4.3.2 වෙනත් ආගම්

- හින්දු
- ඉස්ලාම්
- ක්‍රිස්තියානි



පොළොන්නරුව ශිව දේවාලය

## 4.3.4 සාහිත්‍ය හා රසාස්වාදය

- පාලි → දීපවංශය,සාරාප්ථදීපිකා,අභිදානප්පදීපිකා
- සංස්කෘත → ජානකීහරණය,බාලාවබෝධය,අනුරුද්ධ සතකය
- සිංහල → සියබස්ලකර,සසඳාවත,මුවදෙව්දාවත
- සීගිරි කුරුටු ගී




**සීගිරි කුරුටු ගී සහිත කැටපත් පවුර**

## 4.3.5 වාර්ගික සහජීවනය

- දකුණු ඉන්දීය දෙමළ වෙළන්දන්
- ග්‍රීක හා මැසිඩෝනියන් ප්‍ර දේශ වලින් පැමිණි අයෝනියන්වරු
- ඇෆ්ගනිස්ථානයෙන් පැමිණි කාම්බෝජවරු
- මලය අර්ධද්වීපයෙන් පැමිණි ජාවක වරු
- දෙමළ අධිකාරීන්
- අගම්පඩි සේනාව
- නානාදේසීන්

<u>ශ්‍රී ලංකාවේ පැරණි සමාජය පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න</u>

**01.** ශ්‍රී ලංකාවේ පැරණි සමාජය පාඩමෙහි **4.1** පාලනයේ ස්වරූපය (පිටු අංක **44-46**) කොටස ඇසුරින් පහත වචන වල අර්ථයන් සඳහන් කරන්න.

**1.**එක්තැන්සමිය -

**2.**වත්හිමි-

**3.**මහලේ-

**4.**දසගම් ඇත්තන්-

**5.**වෙජ්ජසාලා-

**6.**උපසග්ගරෝගනාස-

**7.**පසවන්තිනාම සාලා-

**8.**සොත්තිසාලා-

**2.** පැරණි කාලයේ හේන් පිළිබඳ තොරතුරු සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍ර **03**ක් නම් කරන්න.

**3.** පැරණි හේන් වල වගා කළ බෝග මොනවාද?

**4.** අඩ, කෙටූ කනබ යනුවෙන් සෙල්ලිපි වලි හඳුන්වා ඇත්තේ කුමක්ද?

**5.** පැරණි කාලයේ වී වගාව හැඳින්වූ වෙනත් නමක් සඳහන් කරන්න

**6.** අතීතයේ වී වගා කළ කන්න මොනවාද?

**7.** අතීතයේ දී ජලය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පාලකයා විසින් දුටු ආකාරය පිළිඳව සඳහන් වන ප්‍රකාශය කුමක්ද?

**8.** පැරණි සමාජයේ ගව පාලනයේ යෙදුනු පිරිස් ජීවත්වූ ගම් හැඳින්වූ නම කුමක්ද?

**9.**පැරණි මූලාශ්‍ර වල සඳහන් පහත වචන වල අර්ථයන් සඳහන් කරන්න

- කබර -
- තබකර -
- තුලාධාර -

- ස්වර්ණකාර-
- මණිකර -
- කුඹකර -
- තන්තුවාය -

**10.** පැරණි ලංකාවේ වෙළඳාම පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

**11.** පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණුකර නම් කරන්න

1. කඳුරුගොඩ
2. සූකරතිත්ථ
3. මහාතිත්ථ
4. මගන
5. ඌරුවෙල
6. සල්වාතොට
7. කාලතිත්ථ
8. භීමතිත්ථ
9. මහාවාලුකාගාම
10. පල්ලවවංක
11. පුබ නගර
12. තොටළගම

**12.** රූප සටහන් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**A.**



**1.**මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

**2.**මෙය රචනා කර ඇත්තේ  කුමන සියවසේ දී ද?

**3.**මෙහි දක්වා ඇති සංකේත වලින් අර්ථවත් වන්නේ කුමක්ද?

**B.**



**1.**මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

**2.**මෙය හඳුන්වන විශේෂිත නාමය කුමක්ද?

**3.**මේ පිළිබඳ කරුණු සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍ර මොනවාද?

**C.**



**1.මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?**

**2.මෙය කුමන සියවසකට අයත්ද?**

**3.මෙමඟින් නිරූපනය වන්නේ කුමක්ද?**

**සැකසුම- එන්.එල් සිරිමාන්න**

**කෑ/දෙහි/මාගල ක.වි.**